සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 02

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරට යටින් ඉරක් ඇඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් ඇඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

ලබා දෙන දිනය - 2026.03.27 පෙ.ව. 11.15 සිට ප.ව. 12.15 [දෙවැනි පිටුව බලන්න.


01. පහත රූප අතරින් එක සමාන රූප දෙකක් දැකිය හැකි ය. එම රූප දෙක මොනවා ද?



A B C D E

(1) A සහ C (2) B සහ E (3) B සහ D

02. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා A, B, C, D රූප කොටස් අතුරෙන් කුමන කොටස් ගැළපිය හැකි ද?



A B C D E

(1) A, C සහ B (2) A, D සහ E (3) B, C සහ D

03. A රූපයට සමාන රූපයක් ලබා ගැනීමට B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?



A රූපය



B රූපය

(1) 3 (2) 4 (3) 5

04. පහත වාක්‍යයෙහි තද කළු අකුරින් ඇති වචන වෙනුවට පිළිවෙළින් යෙදිය හැකි වචන කට්ටලය තෝරන්න.

නිල් අහසේ පියාසලන **කුරුල්ලෝ කෑම** සොයා ඉගිළ යති.

(1) නබෝ ගැබේ, කුරුල්ලන්, කෑම (2) ගුවනේ, පක්ෂියෝ, ආහාර

(3) ආකාසේ, විහඟයෝ, පියාසලන

05. පහත සඳහන් කවියෙන් කියවෙන්නේ කුමක් ද?

කඳු මුදුනින් උපන් නදියක් වී
සියලු නදී අතරින් දිවයිනේ දිගින් වැඩි වී
නැගෙනහිර වෙරළට අවසානයේ ළං වී
ත්‍රිකුණාමලයේ දී මහ මුහුදට බිලි වී

(1) කළු ගඟ
(2) මහවැලි ගඟ
(3) වලවේ ගඟ

06. පහත සටහනෙහි හිස්තැන් සඳහා වඩාත් සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

රියදුරා	ගොඩබිම	.....
නාවිකයා	.....	නැව
.....	ගුවන	ගුවන්යානය


(1) ලොරිය, ගුවන් නියමුවා, ගොඩබිම

(2) කෝච්චිය, ගොඩබිම, ගුවන් නියමුවා


(3) බසය, ජලය, ගුවන් නියමුවා

✪ **7 සහ 8 ප්‍රශ්නවලට රටාව හඳුනාගෙන හිස්තැනට සුදුසු පිළිතුරු තෝරන්න.**


07.



08.



09. පහත දී ඇති රූප අතුරින් පළමුවන රූපයේ රූප සියල්ල ඇතුළත් පිළිතුර වන්නේ,



(1) (2) (3)

10. වට්ටියක රතු මල් 12 ක් ද නිල් මල් 8 ක් ද කහ මල් 13 ක් ද ඇත. වරකට රතු මල් 2 ක් ද නිල් මල් 1 ක් ද කහ මල් 3 ක් ද එකවර ඉවතට ගනු ලැබේ. එසේ ඉවතට ගත හැකි උපරිම වාර ගණන සහ වට්ටියේ ඉතිරිවන මුළු මල් ගණන පිළිවෙළින්,

(1) 4, 9 (2) 6, 3 (3) 5, 6

✪ **අංක 11 හා 12 ප්‍රශ්නවලට කොටුව තුළ ඇති කේදය කියවා පිළිතුරු තෝරන්න.**

භාජනයක 1/4 ක් වන සේ ජලය දැමූ පසු නිශාන් විසින් එම භාජනයේ බර මනින විට එහි බර 550g ක් බව පවසන ලදී. පසුව ඔහු එම භාජනය සම්පූර්ණයෙන් ම ජලය දමා බර මනින ලදී. එවිට එහි බර 1750g බව පවසන ලදී.

11. හිස් භාජනයේ බර කොපමණ ද?

(1) 200g (2) 150g (3) 100g


12. භාජනය නොමැතිව එහි ඇති ජලයෙහි පමණක් බර කොපමණ විය හැකි ද?

(1) 1200g (2) 1400g (3) 1600g

13. දින 31 ක් ඇති මාසයක ඉරිදා, සඳුදා, අඟහරුවාදා දින පහක් බැගින් තිබේ. එසේ නම් එම මාසයේ 19 වෙනිදා කවදා ද?

(1) බදාදා (2) බ්‍රහස්පතින්දා (3) සිකුරාදා

14. රූපයේ දැක්වෙන වෘත්ත දෙකම එක ම තරමේ ඒවා නම් A සිට B හරහා C අතර දුරට සමාන වනුයේ කුඩා කොටු කීයක දිග ද?



(1) හයකි


(2) අටකි

(3) නවයකි

❍ පහත සඳහන් රූපයේ දැක්වෙන්නේ මේසයක් මත තබා ඇති ටොෆී පෙට්ටි හයකි. මෙහි දී අඹ ටොෆී, සියඹලා ටොෆී, දොඩම් ටොෆී, චොක්ලට් ටොෆී, ස්ට්‍රෝබෙරි ටොෆී සහ දිවුල් ටොෆී ඇතුළත්ව ඇත.

★ පෙට්ටි හතරක් ගෑවෙමින් ඇත්තේ සියඹලා ටොෆී පෙට්ටියේ ය.

★ ස්ට්‍රෝබෙරි පෙට්ටිය ගෑවෙන්නේ අඹ සහ චොක්ලට් පෙට්ටිවල පමණි.



15. එසේ නම් ඉහළින් ම ඇති පෙට්ටිය කුමක් ද?


(1) දිවුල් (2) ස්ට්‍රෝබෙරි (3) දොඩම්

16. යහළුවන් 4 දෙනෙක් A සිට B තෙක් 4km ක දුරක් එක ම වේලාවට පිටත් වෙයි. විහඟගේ ගමන් වේගය සතිරට වඩා වැඩි නමුත් උෂාන්ට වඩා අඩු ය. කුෂාන් විහඟට වැඩි වේගයෙන් ගමන් කරන අතර උෂාන් ද පසු කර යයි. මේ සිවුදෙනා B නගරයට පැමිණෙන අනුපිළිවෙළ වන්නේ,

(1) සතිර, විහඟ, උෂාන්, කුෂාන් (2) කුෂාන්, උෂාන්, විහඟ, සතිර

(3) උෂාන්, විහඟ, සතිර, උෂාන්

❍ පහත දැක්වෙන්නේ වට්ටි 5 ක ඇති මල් වර්ග පිළිබඳ තොරතුරු ය. එම මල් අතර ඉද්ද, රෝස, පිච්ච, නෙළුම් සහ අරලිය මල් අයත් වේ. එහෙත් එහි මල් තබා ඇත්තේ අනුපිළිවෙළකට නොවේ . පහත ආකාරයටය.



★ අරලිය මල දෙපස ඇත්තේ පිච්ච සහ ඉද්ද මල ය.

★ රෝස මලට පසුව අනෙක් සියලු ම මල් එක පෙළට තිබේ.

★ රෝස සහ පිච්ච මල් දෙක අතර නෙලුම් මල තිබේ.

17. අවසානයට ම ඇති මල කුමක් ද?


(1) අරලිය (2) ඉද්ද (3) පිච්ච

18. පිච්ච මල දෙපස ඇති මල් දෙක පිළිවෙළින්,


(1) රෝස සහ අරලිය (2) අරලිය සහ ඉද්ද

(3) නෙලුම් සහ අරලිය


19. පහත කොටුව තුළ ඇති සංඛ්‍යා වඩාත් අර්ථවත්ව පෙන්වා ඇති සටහන කුමක් ද?



20. පහත සඳහන් රූප රටාවේ ? ඇති කොටුවට ආ යුතු රූපය කුමක් ද?



21. 7875, 5364, 6285 යන සංඛ්‍යා පහළටත්, 75684, 8329, 7683 හරහටත් ලැබෙන පරිදි කොටු දැල සම්පූර්ණ කළ විට හතරවන තීරයේ පහළට ඇති සංඛ්‍යාවත් හතරවන පේළියේ හරහට ඇති සංඛ්‍යාවත් පිළිවෙළින්,




(1) 893 සහ 7683

(2) 893 වසහ 545

(3) 536 සහ 682

22. රූපයේ දැක්වෙන පරිදි චතුස්තලයක හැඩය ඇති ඝනවස්තුවකින් අඳුරු කළ කොටස කපා ඉවත් කරන ලදී. එසේ කපා ඉවත් කළ පසු ලැබෙන කැපුම් මුහුණතේ හැඩය සහ ඉතිරිවන කොටසේ මුහුණත් ගණන පිළිවෙළින්,



(1)  , 5 (2)  , 4 (3)  , 5

අද සිකුරාදා. නැන්දා කොළඹ ගියේ පළමු දා ය. ඉන් අනිද්දා දිනය වන්නේ 18 වැනිදා ය. එදින කුෂානිගේ උපන්දිනයයි.

23. නැන්දා කොළඹ ගිය දිනය හා දවස කවදා ද?

(1) 12 සඳුදා (2) 13 බදාදා (3) 12 අඟහරුවාදා

24. කුෂානිගේ උපන්දිනය යෙදෙන දවස කවදා ද?

(1) ඉරිදා (2) සඳුදා (3) අඟහරුවාදා


25. පහත පලතුරු වර්ග කිහිපයක මිල ගණන් දැක්වේ. ඒ තොරතුරු අනුව ගස්ලබු ගෙඩියක මිල කීය ද?

ගස්ලබු 1	දොඩම් 1	ගස්ලබු 1
දොඩම් 1	කොමඩු 1	කොමඩු 1
රු. 130	රු. 150	රු. 160

(1) රුපියල් 90
(2) රුපියල් 60
(3) රුපියල් 70

26. එක්තරා සත්ත්ව ගොවිපොළක එක සතෙකුට බෝවන උණ රෝගයක් වැළඳුණි. මෙහි දී එම රෝගී ලක්ෂණය වූයේ එක් සතෙකුගෙන් තවත් සත්තු 6 දෙනෙකුට මේ උණ රෝගය බෝවීමයි. ඒ අනුව තුන්වන අදියර වන විට රෝගී වූ මුළු සතුන් ප්‍රමාණය කොපමණ ද?

(1) 31 (2) 43 (3) 51

27. 

කුඩා ඝනකවලින් සාදන ලද මෙම කුට්ටිය සම්පූර්ණයෙන් ම තීන්ත බඳුනක ගිල්වා නැවත ගෙන කුඩා ඝනකවලට වෙන් කරන ලදී. එසේ නම් තුන් පැත්තක් පමණක් තීන්ත ගැවුණු ඝනක ගණන කීය ද?

(1) 8 (2) 9 (3) 10

28. ක්‍රීඩා උත්සවයක කණුවල කොඩි ගැට ගසා දමන ලදී. මුල් ම කණුවට රතු පාට කොඩියක් දමා එතැන් සිට කණුවක් හැර කණුවක් රතු පාට කොඩි දමන ලදී. අනෙක් කෙළවරේ සිට කණු දෙකක් හැර එකක් කහ පාටින් දමන ලදී. එහි තිබූ මුළු කණු ගණන 15 කි. එසේ නම් පාට දෙකෙන් ම කොඩි ගැට ගසන ලද කණු ගණන කීය ද?

(1) 22 (2) 3 (3) 4

29. පහත සඳහන් අක්ෂර සඳහා අපිළිවෙළින් සංකේත දී ඇත. කඩල යන වචනය නිවැරදිව ලියා ඇත්තේ,

කාලය	⊗□△
බාලක	⊙✱⊗

(1) ⊙▲⊗ (2) ⊗□⊙

(3) △○⊗

❍ සතිර එක්තරා ස්ථානයකින් ගමන් ආරම්භ කර 8m දුරක් බටහිරට ගමන් කර එතැන් සිට 5m ක දුරක් තම වම් අත පැත්තට හැරී ගමන් කරයි. එතැන් සිට නැවතත් තම වම් අත පැත්තට 4m ක දුරක් ගමන් කරයි.

30. සතිර දැන් සිටින්නේ ආරම්භක ස්ථානයට කුමන දිශාවෙන් ද?

(1) නිරිත දිශාවෙන් (2) ඊසාන දිශාවෙන් (3) වයඹ දිශාවෙන්

31. නැවත ආරම්භක ස්ථානයට යාමට ඔහු ගමන් කළ යුත්තේ කෙසේ ද?

(1) මීටර 4 ක් බටහිරට ගොස් උතුරු දිශාවට මීටර 5 ක් යා යුතු ය.

(2) මීටර 4 ක් නැගෙනහිරට ගොස් උතුරු දිශාවට මීටර 5 ක් යා යුතු ය.

(3) මීටර 5 ක් නැගෙනහිරට ගොස් උතුරු දිශාවට මීටර 4 ක් යා යුතු ය.

❍ බෝල තුනක මිල බෝනික්කෙකුගේ මිලට සමාන වෙයි. සෙල්ලම් කාර් දෙකක මිල බෝල 6 ක මිලකට සමාන වෙයි. බෝනික්කො දෙකක් සහ කාර් තුනක් මිල දී ගැනීමට රුපියල් 225 ක් ගෙවිය යුතු ය.

32. නිවැරදි පිළිතුර තෝරන්න.

(1) බෝනික්කෙක් සහ සෙල්ලම් කාරයක මිල සමාන වෙයි.

(2) බෝලයක මිල රුපියල් 20 කි.

(3) සෙල්ලම් කාරය බෝනික්කාට වඩා රුපියල් 10 ක් වැඩි ය.

33. බෝලයක මිල කීයක් විය හැකි ද?

(1) රුපියල් 20 (2) රුපියල් 15 (3) රුපියල් 25

34. පහත සඳහන් සිදුවීම් කියවන්න. එහි නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

A - කිරිල්ලිය බිත්තර රැක්කා. B - පැටවුන් ලොකු වුණා.

C - බිත්තරවලින් පැටවුන් ආවා. D - කුරුල්ලා කූඩුවක් හැදුවා.


E - පැටවුන්ට කෑම කැවුවා. F - කිරිල්ලිය එහි බිත්තර දැම්මා.

(1) DFCAEB (2) DFACEB (3) DFACBE

35. එක්තරා මාසයක 15, 23 සහ 28 යන දින බදාදා සහ බ්‍රහස්පතින්දා වේ. එසේ නම් අනෙක් දිනය කුමන දවසක් ද?

(1) සඳුදා (2) අඟහරුවාදා (3) බදාදා

36. සමචතුරස්‍රාකාර කඩදාසියක් දෙවරක් නවා රූප සටහනේ පෙනෙන ආකාරයට කඩ ඉර දිගේ කපා වෙන් කරන ලදී. ලැබෙන කැබලි පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,




(1) ත්‍රිකෝණාකාර කැබලි දෙකක් සහ සමචතුරස්‍රයකි.

(2) සමචතුරස්‍රාකාර කැබැල්ලක් සහ ත්‍රිකෝණාකාර කැබලි හතරකි.

(3) ත්‍රිකෝණාකාර කැබලි හතරක් සහ චතුරස්‍රයකි.

37.




ඉහත දැක්වෙන්නේ ළමා පන්තියක සැලැස්මකි. ගුරුතුමිය සිටින තැන සිට පසුපසට ගුරු මේසය හා ගුරු පුටුව රැගෙන පැමිණියහොත් ගුරුතුමිය දෙසට මුහුණලා සිටීමට සිසුන් විසින් ළමා මේස හෝ ළමා බංකු කීයක් අවම වශයෙන් වෙනස් කළ යුතු ද?


(1) 8


(2) 5


(3) 1

38. එක්තරා දවසක වූ සිදුවීමක අවස්ථා හතරක් A, B, C, D රූප මගින් දැක්වේ.










(1) BACD (2) BDAC (3) ADBC

39. පහත රූපයේ ලොකු රෝදය ඊතලයෙන් පෙන්වා ඇති දිශාවට කැරකුවහොත් A සහ B වෙනස් වන්නේ කෙසේ ද?




(1) A පහළට යන අතර, B ඉහළට ගමන් කරයි.

(2) A සහ B ඉහළට ගමන් කරයි.

(3) A ඉහළට යන අතර, B පහළට ගමන් කරයි.

40. රවුම් කිහිපයකින් යුත් රූප සටහනක් මෙහි දැක්වේ. එම සටහන සමඟ ගැළපිය නොහැක්කේ පහත සඳහන් කුමන කියමන ද?



(1) සතුන්, පක්ෂීන්, ගිරවා, මුවා

(2) මල්, ජලයේ පිපෙන මල්, ඕලු මල්, ඉද්ද මල්

(3) ගස්, අඹ ගස්, පුවක් ගස්, කොස් ගස්

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 02

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.03.27 පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.45 [දෙවැනි පිටුව බලන්න.

01. පහත ඡේදය කියවා පිළිතුරු ඡේදය ඇසුරෙන් ම ලියන්න.

ඈත කඳුකර ප්‍රදේශයක තිබුණු සුන්දර ගමක පුංචි පවුලක් ජීවත් විය. අම්මා, තාත්තා, දුව සහ පුතා මේ පවුලේ සාමාජිකයෝ වෙති. මේ දරුවෝ දෙන්නා ඉතා ම හොඳ ගතිගුණ ඇති දරුවන් දෙදෙනෙකි. මේ දෙන්නා අම්මා සමඟ ගමන් බිමන් යාමට හරි ම කැමැත්තක් දක්වති. ඒ යන අතරමඟ දී හමුවන අහල පහල අය සමඟ මේ දරුවෝ දෙදෙනා සුහදව කතා බහ කරති.

1. පුංචි පවුල ජීවත් වූයේ කොහේ ද? .....

2. මේ පවුලේ සිටි සාමාජිකයෝ කවුරුන් ද? .....

3. දරුවෝ දෙදෙනා කැමැත්තක් දක්වන්නේ කුමකට ද?

.....

4. ඡේදයේ සඳහන් යුගල පද දෙකක් ලියන්න. .....

5. ඡේදයේ ඉරි ඇඳි වැකිය අතීත කාලයට හරවා ලියන්න.

.....

6. සාමාජිකයෝ ඉර ඇඳි අක්ෂරයෙහි ඇති පිල්ලම් ලියන්න. .....

02. ප්‍රාණවාචී බහුවචන අතීතකාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

1. නැටුවා ය 2. නැටුවේ ය 3. නැටුවෝ ය

03. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යක් ලියන්න.

අපට / ඔරුවකුත් / කබල් / පොඩි / ගල් වංගෙඩියකුත් / ගමරාල / දුන්නේ ය

.....

04. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. උපක්‍රමය, විමර්ශණය, ප්‍රදර්ශනය, විශේශණ

2. මර්ධනය, ගංඟාව, ආපනශාලාව, කාර්යාලය

3. විශ්මය, වීරෝධාර, කලුපාට, නිශ්ශබ්ද

05. පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු ක්‍රියාපදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

1. මම ලස්සනට චිත්‍රයක් ..... (අඳිමි / අඳිමු)

2. ඔවුහු අත්පොළසන් ..... (දුන්නේ ය / දුන්හ)

3. ගංගා පහළට ගලා ..... (බසියි / බසිති)

4. ඇය ගීත ගායනා ..... (කළේ ය / කළා ය)

5. වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා ..... (කරති / කරයි)

විභාග අංකය : .....

06. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

මොකක් ද නිදහස් උත්සවය කියන්නේ කවීෂා ඇසුවා ය

07. 1. පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

..... ගියා වගේ.

2. පහත සඳහන් ප්‍රස්තාව පිරුළෙහි අදහස ලියන්න.


කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ.

.....

08. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

අක්කා ලස්සන ගවුමක් මිල දී ගනියි. - .....

09. රවුම තුළ ඇති අක්ෂර යොදා පහත වගුව පුරවන්න.



මධ්‍ය අක්ෂර	අවරෝහණ අක්ෂර	ආරෝහණ අක්ෂර
1.	2.	3. .....

10. පහත යුගල පදය සම්පූර්ණ කරන්න.

ගෙවල් .....


11. සුදුසු ස්ත්‍රී ලිංග පදය ලියන්න.

නළුවා - .....

12. සුදුසු බහුවචන පදය ලියන්න.

උදැල්ල - ..... *(ලකුණු 26)*

13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.



14. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

1. Horse - ..... 2. Clouds - .....

15. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

1. do / homework / your / Please

.....

2. want / match / I / to / watch / a

.....

16. **"තාමරෙ පූ" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.**

.....

17. **පහත සඳහන් වාක්‍ය දෙමළ බසින් කියන ආකාරය සිංහල වචනවලින් ලියන්න.**

මට මල්ලී කෙනෙක් ඉන්නවා. - .....

(ලකුණු 8)

➢ **පහත සඳහන් ප්‍රශ්න සියල්ලට ම අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

18. (1) දස දහසස්ථානයේ 6, දහයස්ථානයේ 5, සියයස්ථානයේ 3, එකස්ථානයේ 8, දහසස්ථානයේ 4 වන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.....

(2) රවුම් කළ සංඛ්‍යාවේ ස්ථානීය අගය ලියන්න.

(9) 2 6 4 - .....

19. පහත සඳහන් සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යාව ලියන්න.

.....	40 000	.....

20. පහත සඳහන් සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

28 195, 28 956, 28 095 - .....

❖ කර්මාන්ත ශාලාවක මාස තුනක නිපද වූ යෝගට් ප්‍රමාණයන් පහත දැක්වේ. ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

මාසය	මැයි	ජුනි	ජූලි
යෝගට් ප්‍රමාණය	2438	3564	4180

21. මාස තුනේ ම නිපද වූ මුළු යෝගට් ප්‍රමාණය කොපමණ ද?

.....


22. මැයි මාසයට වඩා ජූලි මාසයේ නිපද වූ යෝගට් ප්‍රමාණය කොපමණ ද? .....

23. පහත සංඛ්‍යා රටා තේරුම් ගෙන හිස්තැන් පුරවන්න.

(1) 85, 94, ..., 112, ... (2) 133, 140, 147, 154, ...

24. (1) වෙරළු ගෙඩි 48 න් 3/4 ක ඇති වෙරළු ගෙඩි ප්‍රමාණය කීය ද? .....

(2) පාට කළ කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස දක්වන්න.



.....

25. කූඩයක නාරං ගෙඩි 435 ක් තිබුණි. එවැනි කූඩ 4 ක ඇති නාරං ගෙඩි මුළු ප්‍රමාණය කොපමණ ද? .....

26. පොත් 945 ක් එක් ළමයෙකුට පොත් 3 බැගින් බෙදා දුන්නේ නම් ළමයි කී දෙනෙකුට පොත් ලබා දිය හැකි ද? .....

27. පහත සඳහන් වගුව පුරවන්න.


පැය 24 ඔරලෝසුවේ වේලාව	පැය 12 ඔරලෝසුවේ වේලාව
22 : 40	.....
.....	පෙරවරු 2.40


28. 1. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	මිල දී ගත් ප්‍රමාණය	1kg ක මිල		වටිනාකම	
		රුපියල්	සත	රුපියල්	සත
හාල්	2kg	.....	.....	460	00
පිටි	.....	350	00	175	00
සීනි	250g	248	00	.....	.....
			මුළු මුදල	.....	.....

2. ඉහත බිල්පත සඳහා රුපියල් 1000 ක මුදල් නෝට්ටුවක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද? .....

29. පහත සඳහන් ඝනවස්තුවල නම් ලියන්න.

(1)  .....

(2)  .....

30. සනුරට 15km ක දුරක් යා යුතු විය. ඔහු එයින් 12km 750m ක දුරක් බස් රථයෙන් ගිය අතර ඉතුරු දුර ත්‍රීරෝද රථයෙන් ගමන් කළේ ය. ඔහු ත්‍රීරෝද රථයෙන් ගමන් කළ දුර කොපමණ ද? .....

(ලකුණු 30)

➢ **අංක 31 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

31. වර්ණවත්, සුවඳවත් මෙන් ම රසැති ගෙඩි සහිත ශාකයක පැතිරීම බහුලව ම සිදුවන්නේ කුමන ආකාරයෙන් ද?

1. සතුන් මගින් 2. ජලය මගින් 3. සුළඟ මගින්

32. කිරි බී වැඩෙන සතෙකි.

1. කුකුළා 2. වවුලා 3. සමනලයා

33. රාත්‍රියට පිපෙන මල්වල වර්ණය වන්නේ,

1. රතු 2. සුදු 3. නිල්

34. සුළඟ මගින් පැතිරී යන බීජ වර්ගයකි.

1. වරා 2. කොස් ඇට 3. මදටිය

35. 'දොන් පුල්ලේ වෙදරාළ' නමින් හැඳින්වූයේ,

1. මොනරවිල කැප්පෙටිපොළ දිසාව 2. ගොංගාලේගොඩ බණ්ඩා

3. වීර පුරන් අප්පු

36. මහවැලි ගඟ සහ වලවේ ගඟ මුහුදට වැටෙන ස්ථාන දෙක පිළිවෙළින්,

1. මඩකලපුව සහ හම්බන්තොට 2. ත්‍රිකුණාමලය සහ අම්බලන්තොට

3. ත්‍රිකුණාමලය සහ අම්බලන්ගොඩ

37. රෝගවාහක පුද්ගලයෙක් මගින් බෝවන රෝගයකි.

1. දියවැඩියාව 2. පැපොල 3. බරවා

38. සතුරන්ගෙන් ආරක්ෂා වීමට සතුන් හැඩගැසී ඇති ආකාරයක් වන්නේ,

1. ශාකවල කොළ පැහැති පත්‍ර අතර කොළ පැහැති පණුවන් සිටීමයි.

2. ගිරවාට යම් යම් දේ කැපීමට තියුණු හොටක් තිබීමයි.

3. සර්පයින්ට එළියට දැමිය හැකි දිගු දිවක් තිබීමයි.

39. ගෙවත්තට පැමිණෙන පක්ෂියකු වන ඇටිකුකුළාට,

1. කළු පැහැති පිහාටු සහ සුදු පැහැති ඇස් ඇත.

2.කළු පැහැති හා නිල් පැහැති පිහාටු සහ රතු පැහැති ඇස් ඇත.

3. කළු පැහැති හා දුඹුරු පැහැති පිහාටු සහ රතු පැහැති ඇස් ඇත.

40. අභ්‍යවකාශ ගත කරන චන්ද්‍රිකා භාවිත කරමින් පණිවිඩ හුවමාරු ක්‍රමයක් නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කර ඇත්තේ කවුරුන් විසින් ද?

1. ආතර් සී. ක්ලාක් මහතා 2. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා


3. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා


41. පුද්ගලයකු ගමන් කිරීමේ දී නිවැරදිව පාදය තැබිය යුතු ආකාරය වන්නේ පිළිවෙළින්,


1. විලුඹ, පතුල, ඇඟිලි තුඩු ලෙසයි. 2. ඇඟිලි තුඩු, පතුල, විලුඹ ලෙසයි.

3. විලුඹ, ඇඟිලි තුඩු, පතුල ලෙසයි.

42. වියළි කෝෂයකට විදුලි පන්දම් බල්බ දෙකක් වයර් කැබලි මගින් සම්බන්ධ කර ඇති අවස්ථා තුනක් පහත දැක්වේ. ඒ අතුරෙන් එක් බල්බයක් පමණක් දැල්වෙන අවස්ථාව කුමක් ද?

1. 

2. 

3. 

43. ක්ෂීරපායී සත්ත්වයකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,

1. බිත්තරවලින් පැටවුන් බිහිවීමයි. 2. ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට ගැනීමයි.

3. මව්කිරිවලින් පැටවුන් පෝෂණය කිරීමයි.

44. වගා ආරක්ෂා වීම සඳහා සිදුවන ස්වාභාවික ක්‍රියාවක් වන්නේ කුමක් ද?

1. බෝග වගාව වටා ඉනි වැටක් බැඳීම. 2. පිටි මකුණන් සඳහා සබන් වතුර යෙදීම.

3. ඇටිකුකුළන් විසින් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම.

45. දියෙහි ගිලුණු අයෙකුට ප්‍රථමාධාර දීමේ දී පළමුවෙන් ම කළ යුතු වන්නේ කුමක් ද?

1. තෙත ඇඳුම් ඉවත් කිරීම.

2. පොරවනයක් මගින් ශරීරයේ උණුසුම ආරක්ෂා කිරීම.

3. හොඳින් හුස්ම ගන්නේ දැයි පරීක්ෂා කිරීම.

46. සිදුරු කැමරාවක තිරය සෑදීමට යොදා ගන්නේ,

1. වර්ණ කඩදාසියකි. 2. සුදු කාඩ්බෝඩ් කැබැල්ලකි.

3. සුදු කඩදාසියකි.

47. ගලා යන ජලය මගින් කරකැවිය හැකි ජල රෝදයක් සෑදිය නොහැක්කේ,

1. කෙසෙල් බඩ හා ලී පතුරු මගිනි. 2. කප්පියක් හා ලණු කැබලි මගිනි.

3. ෂූජ්ෆෝම් රවුමක් හා යෝගට් හැඳි මගිනි.

48. අනාගතයේ දී බලශක්තිය අඩු වී යන බැවින් ඒ සඳහා ගත හැකි විසඳුමක් වන්නේ,

1. වාහනවලට ඉන්ධන වශයෙන් පෙට්‍රල් යොදා ගැනීමයි.

2. සුළං බලය යොදා ගනිමින් විදුලිය නිපදවීමයි.

3. දුම්රිය ධාවනය සඳහා ගල් අඟුරු යොදා ගැනීමයි.

49. කේතලයක් ලිප තබා වතුර රත් කරන විට එහි කෙණ්ඩියෙන් පිටවන ජලය හඳුන්වන්නේ,

1. වාෂ්ප 2. වාතය 3. ද්‍රාවක

50. කාබනික පොහොර භාවිතයේ ඇති වාසියකි.

1. විෂ රහිත ආහාර ගැනීමට හැකි වීම. 2. විෂ සහිත ආහාර ගැනීමට හැකි වීම.

3. පොහොර මිලදී ගැනීමට විශාල මුදලක් වැය වීම.

51. වායව පරිසරයේ ජීවත්වන සතෙකුගේ ලක්ෂණ වන්නේ,

1. පිහිනීමට වරල් තිබීම. 2. පියෑඹීමට පිහාටු, පියාපත් තිබීම.

3. සමේ වර්ණය වෙනස් කර ගත හැකි වීම.

52. 

"අයඩීන්කරණය කරන ලද ලුණු පැකට්ටුවක පහත සඳහන් සංකේතය දක්වා ඇත." මෙයින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

1. තෙතමනය ඇති තැනක නොතබන්න.

2. නළ ජලය යොදා ගැනීමෙන් වළකින්න.

3. නොසෝදා පාවිච්චි කරන්න.

53. ශාකයකට මුල්වලින් ලැබෙන ප්‍රයෝජනයකි.

1. ශාකය අලංකාර කිරීම. 2. පාංශු බාදනය වැළැක්වීම.

3. ශාකයට අවශ්‍ය ජලය හා පොහොර උරා ගැනීම.

54. සල් මලක පෙති ගණන වන්නේ,

1. 4 2. 6 3. 5

55. මුස්ලිම් ජාතික කාන්තාවන් අඳින ඇඳුම වන්නේ,

1. හබාය 2. පුම්මා 3. ඉජාහාප්

56. දකුණු පළාතට අයත් නගරයක් වන්නේ,

1. කළුතර 2. බලන්ගොඩ 3. අම්බලන්ගොඩ

57. හැඩය අනුව ශාක පත්‍ර වර්ග කළ විට වඩාත් ගැළපෙන කාණ්ඩය තෝරන්න.

1. උණ - කොස් 2. බණ්ඩක්කා - කොට්ටම්බා

3. සියඹලා - කතුරුමුරුංගා

58. පක්ෂියෙකුට නොමැති ලක්ෂණයකි.

1. ඇස් හැරවීමට හැකි වීම. 2. පියෑඹීමට හැකි වීම.


3. පාද යුගලයක් තිබීම.

59. අකුණු සැර වැදීමට හේතුවක් නොවන්නේ,

1. අකුණු සහිත අවස්ථාවක දී රූපවාහිනිය නැරඹීම.

2. අකුණු සහිත අවස්ථාවක දී නිවස තුළ ඇඳක් මත සිටීම.

3. අකුණු සහිත අවස්ථාවක දී දුරකථන භාවිත කිරීම.

60. 

පහත රූපයේ මලක කොටසක් දක්වා ඇත. එහි A මඟින් දක්වා ඇත්තේ,

1. නටුව
2. රේණු
3. කලංකය

(ලකුණු 30)

61. "කුඩුවක සිරවී සිටින ලේන් පැටියෙකු දෙස කුමාර බලා සිටියේ ය." කුමාර ඔබ යැයි සිතා ඔබට සිතෙන දේ නිර්මාණාත්මක වැකි **3ක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

.....

.....

.....

.....

.....

.....

(ලකුණු 6)



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 02

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(3)
02	(2)
03	(2)
04	(2)
05	(2)
06	(3)
07	(3)
08	(1)
09	(1)
10	(1)
11	(2)
12	(3)
13	(2)
14	(3)
15	(2)
16	(2)
17	(2)
18	(3)
19	(2)
20	(3)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(2)
22	(1)
23	(3)
24	(2)
25	(3)
26	(2)
27	(3)
28	(2)
29	(1)
30	(1)
31	(2)
32	(1)
33	(2)
34	(2)
35	(2)
36	(2)
37	(3)
38	(2)
39	(1)
40	(3)

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි. -